# මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ.පො.ස (උසස් පෙල) ප්‍රතිඵල ඉහළ නැංවීමේ කඩිනම් ව්‍යාපෘතිය-2020 ( ඒකකය 05 )

ආර්ථික විද්‍යාව-1 | 21 | S | 1 | කාලය : විනාඩි 25යි.

උපදෙස්

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **1 සිට 50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුර තෝරාගෙන එයට යටින් ඉරක් අඳින්න.

1. ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණ අවදියේ දි,
   1) ආයෝජනය හා සේවා නියුක්තිය ඉහල නගින අතර නිමවුම පහළ වැටේ.
   2) ආයෝජනය හා නිමවුම ඉහළ නගින අතර සේවා නියුක්තිය පහල වැටේ.
   3) ආයෝජනය , නිමවුම හා සේවා නියුක්තිය ඉහළ නගී.
   4) ආයෝජනය , නිමවුම හා සේවා නියුක්තිය පහළ වැටේ.
   5) ආයෝජනය පහල බසින අතර නිමවුම හා සේවා නියුත්තිය ඉහළ නගී

2. දළ දේශීය නිෂ්පාදිතය නිර්වචනය කරනු ලබනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයකින් ද?
   1) දෙන ලද කාලපරිච්ඡේයක් තුලදි ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන මුළු නිමවුම් ප්‍රමාණයයි.
   2) දෙන ලද කාලපරිච්ඡේදයක් තුලදි දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලබන සියළුම භාණ්ඩ හා සේවාවල වටිනාකමයි
   3) දෙන ලද  කාලපරිච්ඡේයක් තුල දේශීය වෙළෙඳපොළෙහි අලෙවි කරනු ලබන සියළුම අවසාන භාණ්ඩ හා සේවාවල වටිනාකමයි.
   4) දෙන ලද කාලපරිච්ඡේදයක් තුලදි ආර්ථිකයක් විසින් නිෂ්පාදනය කරනු ලබන සියළු අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වෙළෙඳපොළ වටිනාකමයි.
   5) දළ ජාතික ආදායම හා දළ දේශීය වියදම අතර පරතරයයි

3. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම ධන අගයක් ගනී නම්,
   1) දළ දේශීය වියදමට වඩා දළ දේශීය නිෂ්පාදිතය විශාලවේ.
   2) දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ ජාතික ආදයම විශාලවේ.
   3) දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ ජාතික ආදායම කුඩාවේ.
   4) දළ ජාතික ආදායමට වඩා වැයකළහැකි දළ ජාතික ආදායම විශාලවේ.
   5) දළ දේශීය නිෂ්පාදිතයට වඩා ශුද්ධ දේශීය නිෂ්පාදිතය විශාලවේ.

4. වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය ලබා ගැනීම සඳහා දළ දේශීය වියදමට ඔබ කරන ගැලපීම් මොනවාද?
   1) විදේශීය ශුද්ධ අපනයන ගැලපිය යුතුය.
   2) විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදයම ගැලපිය යුතුය.
   3) විදේශීය ශුද්ධ ද්විතික ආදායම ගැලපිය යුතුය.
   4) ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ ශේෂය ගැලපිය යුතුය.
   5) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය ගැලපිය යුතුය.

5. පෞද්ගලික පරිභෝජන වියදමේත් රාජ්‍ය පරිභෝජන වියදමේ ඇතුලත් පුද්ගල පරිභෝජන වියදමේත් එකතුව හැඳින්විය හැක්කේ.
   1) කුටුම්භ පරිභෝජන වියදම ලෙසය.
   2) මුළු පරිභෝජන වියදම ලෙසය.
   3) අවසාන පරිභෝජන වියදම ලෙසය.
   4) සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලෙසය.
   5) දළ දේශීය වියදම ලෙසය

6. නිෂ්පාදන ක්‍රියාවලියේ නිරතවීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනයට අවශ්‍ය වත්කම් හිමිකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ ආයතනික ඒකක වලට ලැබෙන ආදායම හැඳින්විය හැක්කේ.
   1) ප්‍රාථමික ආදායම ලෙසය.
   2) දළ මෙහෙයුම් අතිරික්තය ලෙසය.
   3) ශුද්ධ මෙහෙයුම් අතිරික්තය ලෙසය.
   4) මිශ්‍ර ආදායම් ලෙසය.
   5) සේවක ආදායම් ලෙසය

7. රටක දළ ආයෝජනය සහ දේශීය ඉතුරුම් අතර පරතරය හැඳින්විය හැක්කේ,
   1) ප්‍රාග්ධන ක්ෂයවීම් ලෙසය.
   2) විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම ලෙසය.
   3) විදේශීය ශුද්ධ අපනයන ලෙසය.
   4) විදේශීය ශුද්ධ ද්විතික ආදායම ලෙසය.
   5) ගෙවුම්ශේෂයේ වර්තන ගිණුමේ ශේෂය ලෙසය

8. රටක මුළු සම්පත් හෙවත් සම්පත් සංයුතිය යනු ,
   1) දළ දේශීය නිෂ්පාදිතය හා විදේශීය ශුද්ධ අපනයනවල එකතුවයි.
   2) දළ දේශීය නිෂ්පාදිතය හා විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම්වල එකතුවයි.
   3) දළ දේශීය නිෂ්පාදිතය හා අපනයනවල එකතුවයි.
   4) දළ දේශීය නිෂ්පාදිතය හා ආනයනවල එකතුවයි.
   5) දළ දේශීය වියදම හා විදේශීය ශුද්ධ අපනයනවල එකතුවයි.

9. එක්තරා වර්ෂයක යම් ආර්ථිකයක දළ දේශීය වියදම රුපියල් මිලියන 4000 ක් ද, අපනයන රුපියල් මිලියන 500 ක් ද, ආනයන රුපියල් මිලියන 300ක් ද වේ. මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය සහ සම්පත් උපයෝජනය කොපමණද?

| | දළ දේශීය නිෂ්පාදිතය | සම්පත් උපයෝජනය |
|---|---|---|
| 1) | රුපියල් මිලියන 4200 කි. | රුපියල් මිලියන 4500 කි. |
| 2) | රුපියල් මිලියන 4200 කි. | රුපියල් මිලියන 4300 කි. |
| 3) | රුපියල් මිලියන 4800 කි. | රුපියල් මිලියන 4500 කි. |
| 4) | රුපියල් මිලියන 4800 කි. | රුපියල් මිලියන 4300 කි. |
| 5) | රුපියල් මිලියන 4300 කි. | රුපියල් මිලියන 4500 කි. |

10. කිසියම් රටක කාලපරිච්ඡේද දෙකක් අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 4% කින් ද, පොදු මිල මට්ටම 8% කින්ද ඉහල ගොස් ඇති බවක් සලකන්න පහත. සඳහන් කවර පැහැදිලි කිරීමක් මේ සඳහා වඩාත් යෝග්‍ය වේද?
   1) පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය 4% කින් ඉහළ ගොස් ඇත.
   2) පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය 4% කින් පහල ගොස් ඇත.
   3) පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය 2% කින් ඉහළ ගොස් ඇත.
   4) පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය 12% කින් ඉහළ ගොස් ඇත.
   5) පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය 12% කින් පහළ ගොස් ඇත.

| ආර්ථික විද්‍යාව-11 | 21 | S | 11 | කාලය: විනාඩි 35 යි. |
|---|---|---|---|---|

( 1 )

1. දළ දේශීය නිෂ්පාදනය සහ දළ ජාතික ආදායම අතර වෙනස පැහැදිලි කරන්න. ( ලකුණු 04 යි )
2. මිනුම් නොකරන සහ ඒ නිසාම දළ දේශීය නිෂ්පාදනය තුලට ඇතුලත් නොකරන ඵලදායි ආර්ථික කටයුතු මොනවාද? ( ලකුණු 02 යි )
3. ශ්‍රී ලංකා ආර්ථිකය තුල ක්‍රියාත්මක වන පහත සඳහන් ඒකක කුමන ආයතනික අංශයකට අයත්වේදැයි හේතු සහිතව පැහැදිලි කරන්න.
   I. මහජන බැංකුව .
   II. පදික වේදිකාවේ රෙදි වෙළෙඳාමේ යෙදෙන්නෙකු.
   III. කර්මාන්ත උද්‍යානය තුල පිහිටි අපනයනය සඳහා කමිස නිපදවන ඇඟලුම් කම්හලක්.
   IV. ගිණුම් පවත්වා නොගනිමින් රසකැවිලි නිෂ්පාදනය කරන නිවසක් . (ලකුණු 04 යි)

4. එක්තරා වර්ෂයක කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල දත්ත පෙළක් මතු දැක්වේ.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 24000 |
| අපනයන | 5500 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | -4000 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 8000 |
| ආනයන | 7500 |
| තොග වෙනස්වීම් | 2400 |
| විදේශීය ශුද්ධ ද්විතික ආදයම් | 6000 |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | 12000 |

අදාල දත්ත තෝරා ගනිමින් මතු සඳහන් දෑ ගණනය කරන්න.

I. දළ දේශීය නිෂ්පාදිතය.
II. වැයකළහැකි දළ ජාතික ආදායම.
III. දේශීය ඉතුරුම්.
IV. දේශීය ඉතුරුම් අනුපාතිකය
V. ආර්ථිකයේ සම්පත් සංයුතිය සහ සම්පත් උපයෝජනය. ( ලකුණු 2×5= 10)